# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## නිවාස භාරකරු / භාරකාරිණී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සිංහල හෝ දමිළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා වෙනත් ඕනෑම විෂයයක් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක්වර සමත්වීම.

**සහ**

අ.පො.ස. (උ/පෙ) විභාගය (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) විෂයන් තුනකින් සමත්වීම.

**පළපුරුද්ද :**

ශිෂ්‍ය නේවාසිකාගාරාධිපති වරයකු ලෙස පිළිගත් ආයතනයක වසර තුනක (03 ක) පළපුරුද්ද හෝ සමාන සුදුසුකම්.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

MN1 - ශ්‍රේණිය III

රු. 36,640 - 10X405 - 40,690/- මාසිකව

**රැකියා නියුක්තියේ කොන්දේසි :**

ස්ථිර හා ආර්ථසාධක අරමුදල පදනම.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, පිටපතක් සෘජුව එවිය යුතුය. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කළ සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

තනතුර සඳහා යම් අයදුම්කරුවකු පත්කිරීමේ / පත් නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන්, සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන, නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහිත තම අයදුම්පත් 2024 සැප්තැම්බර් 09 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**